**සීතාවකපුර නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**
-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 29 දින සභාවේ ලේකම්වරිය වෙත යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, **මූල්‍ය ප්‍රකාශන** වලින් 2015 දෙසැම්බර් 31 දිනට සීතාවකපුර නගර සභාවේ **මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය** ක්‍රියාකාරිත්වය හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මිල දී ගත් රු.62,500 ක් වූ බිම් තරාදියේ වටිනාකම රු.6,250 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.56,250 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිල දී ගත් රු.109,800 ක් වූ ගස් කපන යන්ත්‍රයේ වටිනාකම රු.122,000 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.12,200 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.288,002 ක් වටිනා ජල පොම්ප 02 ක්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත නොකර ලී බඩු හා සවිකිරීම් ගිණුමේ රු.232,866 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම රු.288,002 ක් අඩුවෙන් ද ලී බඩු හා සවිකිරීම් ගිණුම රු.232,866 ක් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිල දී ගත් රු.221,000 ක් වටිනා ජල පොම්ප සඳහා පැනල් බෝඩ් 02 ක් සහ රු.3,020 ක් වූ රවුටරයක එකතු වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරන ලද දේපල ණය පොළී ප්‍රතිපූර්ණය කිරීම් රු.164,089 ක් ආදායම් ආධාර යටතේ ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ නාගරික සංවර්ධන අධිකාරි බැංකු ගිණුමේ තැන්පත් කළ රු.129,837 ක් ලෙජර් ගිණුම් වල දක්වා නොතිබුණි.තවද 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ තැන්පත් කළ යුතු රු.186,184 ක්, නාගරික සංවර්ධන අධිකාරියේ තැන්පතු ගිණුමට ගෙන නොතිබුණි.

(උ) රු.11,250 ක් වටිනා විල්බැරෝ 5 ක වටිනාකම මෝටර් රථ හා කරත්ත ගිණුමෙන් ඉවත් කර නොතිබීම හේතුවෙන් මෝටර් රථ හා කරත්ත ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

## 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාළව මූල්‍ය ප්‍රකාශන ගිණුම් අනුව ශේෂය රු.52,862,981 ක් වූ අතර ඒවාට අදාල උපයෝගී ලේඛණ අනුව ශේෂය රු.51,941,561 ක් වුයෙන් රු.921,420 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 1.3.3 නිරවුල් නොකරන ලද ගිණුම්

------------------------------

(අ) දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.3,071,646 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.98,205,268 ක් වූ ණය හිමි ශේෂය තුළ ඉකුත් වර්ෂ වලට හා ප්‍රවර්තන වර්ෂයට අදාල අත්‍යාවශ්‍ය සේවා ලබා ගැනීම වෙනුවෙන් රාජ්‍ය ආයතනවලට ගෙවිය යුතු එකතුව රු.64,299,416 ක් වූ ශේෂයක් නිරීක්ෂණය වූ අතර එය මුළු ණය හිමියන්ගෙන් සියයට 65 ක් විය. ප්‍රවර්තන වර්ෂයේ ද එම ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

එකතුව රු.15,350,876 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සඳහා අදාළ විගණන සාක්ෂි නොමැති වීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.7,647,822 ක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩිවූ පුනරාවර්තන වියදම රු.1,122,703 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

--------------

2014 වර්ෂය තුළ දී ඝන අපද්‍රව්‍ය සඳහා ලද රු. 150,000 ක් ද, 2011 වර්ෂයේ දී "ස්වර්ණපුර" තරඟයේ පළමු ස්ථානය ලබා ගැනීම වෙනුවෙන් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් ලද රු.550,000 ක් ද සහ "ස්වර්ණ පුර" තරඟයේ ප්‍රසාද දීමනා ලෙස ලද රු.300,000 ක මුදල ද 2016 ජුලි 31 දින දක්වා කිසිදු කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි.

## 3 ආදායම් පරිපාලනය

---------------------

### 3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------

**සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| ආදායම් විෂයය | 2015 ජනවාරි 01 දිනට හිඟ ශේෂය | බිල් කිරීම | තථ්‍ය ලැබීම් | 2015දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,610,272 | 19,512,094 | 15,751,082 | 10,159,184 |
| කඩ කුලී | 3,054,217 | 18,196,985 | 17,527,829 | 3,723,373 |
| බලපත්‍ර ගාස්තු | 43,543 | 311,655 | 311,655 | 43,543 |
| ව්‍යාපාර බදු | 46,915 | 676,500 | 675,500 | 46,915 |

**3.1.1 වරිපනම් බදු**

**-------------**

සමාලෝචිත වර්ෂය තුල වරිපනම් හා බදු බිල්කල ආදායමෙන් සියයට 35 ක් වු රු.6,771,704 ක් අයකරගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දී අයවිය යුතු සමුච්චිත හිඟ වරිපනම් මුදල රු.10,159,184 ක් විය.

**3.1.2 හිඟ කඩකුලී**

--------------

2015 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 48 කින් මාස 05 ක් ඉක්මවා හිඟව තිබූ කඩ කුලී මුදල රු.897,125 ක් විය. මෙකී වෙළඳසැල් හිමියන් සම්බන්ධයෙන් බදු කුලී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට සභාව පියවර ගෙන නොතිබුණි.

**3.1.3 මස් වෙළඳසැල් බදු**

**--------------------**

සභාවට අයත් පුවක් පිටිය ඉරිදා පොලේ ඌරු මස් වෙළඳසැල සහ එළහරක් මස් වෙළඳසැල 2015 වර්ෂය සඳහා බදු නොදීම නිසා සභාවට අහිමි වු අදායම රු.117,200 ක් විය.

**3.1.4 බලපත්‍ර ගාස්තු**

**---------------**

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරණ අති විශේෂ ගැසට් නිවේදනය අනුව (ඇ) අනුව ව්‍යාපාර සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු වුවද, 2015 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර ස්ථාන පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර නොතිබුනි. වෙළඳ බලපත්‍ර ලේඛණයට අනුව පරිසර බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර ගණයට ගැනෙන ව්‍යාපාර 113 ක් පැවතින.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

** අ) අවිධිමත් ගනුදෙනු**

---------------------

කසල අංගණයේ කසල තුනී කිරීම සඳහා මිල ගණන් කැඳවීමකින් සහ ගිවිසුම්ගත වීමකින් තොරව **PC** 60 ප්‍රමාණයේ ස්කැවේටර් යන්ත්‍රයක් කුලී පදනම මත ලබා ගෙන **2015** ජනවාරි සිට අප්‍රේල් දක්වා පැයකට රු.750 බැගින් මුළු පැය 123.3 කට රු.92,475 ක් ද, 2015 මැයි සිට ජුලි දක්වා පැයකට රු. 2,200 බැගින් මුළු පැය 399 ක් සඳහා රු.877,800 ක් ද ගෙවා තිබුණි.

**ආ) නාගරික සංවර්ධන අධිකාරී බැංකු ගිණුම**

**------------------------------------------**

1993 නොවැම්බර් 18 දින සැලසුම් චක්‍රලේඛ 15 දරණ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛය ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමට 1991 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.315,321 ක මුදලක් ලැබී තිබුණි. මෙම මුදල්

නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතිය ලත් සංවර්ධන යෝජනාවන්ට පමණක් යොදාගත යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයේදි රු.315,321 ක මුදල කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා ආයෝජනය කර නොතිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නගර සභා ආඥා පනතේ 153 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පැනවීමකින් තොරව 2015 ජනවාරි සිට නොවැම්බර් දක්වා පෞද්ගලික බස් රථ නැවතුම් මත අය කරන ගාස්තු, සහ අපතේ දමන ආහාර (ඉදුල්) විකිනීමෙන් ලද ආදායම් හා ප්‍රතිචක්‍රිකරණ ආදායම් වශයෙන් රු.3,129,653 ක් උපයා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ වයස අවු.60 සම්පූර්ණ වීම මත විශ්‍රාම යාමේ විධිවිධාන වලට පටහැනිව අවු.60 ඉක්ම වු අනියම් පදනම මත සේවය කරන නිලධාරියකු සහ වයස අවු.60 – 80 අතර කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් 18 දෙනෙකු සඳහා 2015 වර්ෂයේදී රු.12,339,783 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරින් වෙත නිකුත් කළ නමුත් නොපියවා ඇති රු.1,029,055 ක අත්තිකාරම් ශේෂය තුළ වසර 06 ක සිට පැවතඑන රු.842,357 ක අත්තිකාරම් ශේෂයක්ද විය.

(ඈ) තැන්පත් කර වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු රු. 43,872,348 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4.3 වාහන පාලනය

(i) වටිනාකම සොයාගත නොහැකි පරිත්‍යාග ලෙස ලද බැකෝ ලෝඩරයක් සහ කාලවකවානු හා වටිනාකම සොයා ගත නොහැකි ලියාපදිංචි නොකළ බොබ්කැට් යන්ත්‍රයක් සභාව සතු විය.

(ii) වර්ෂ කිහිපයක සිට ගලි බවුසරයේ යාන්ත්‍රික දෝෂයන් වරින් වර උද්ගත වි තිබීම නිසා ගලි රථ ආදායම 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය වන විට සියයට 79 කින් අඩු වී තිබුණි.

(iii) 2015 ඔක්තෝම්බර් 29 දින අළුත්වැඩියාව සඳහා පෞද්ගලික ගරාජයක් වෙත භාර දුන් මහේන්ද්‍රා කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා ලබා දී තිබු කාල සීමාව ඉක්මවා තිබුණ ද ගිවිසුමේ අංක 05 ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(iv) රු.226,050 ක් වු ත්‍රී රෝද රථයක්ද, රු.328,000 ක් වු ඉසුසු කැබ් රථය සහ ටැෆේ ට්‍රැක්ටරයක් ධාවනය කළ නොහැකි තත්වයෙන් සභා පරිශ්‍රය තුල ගාල් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

--------------------------------------

### 5.1 කාර්යසාධනය

----------------

සමාලෝචිත වර්ෂයේ දී විවිධ අරමුදල් යටතේ වූ ව්‍යාපෘති 95 ක,සභා කර්මාන්ත 44 ක සහ දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනක වැඩ අවසන් කර නොතිබුණි.සභා කර්මාන්ත වල සත්‍ය පිරිවැය ගණනය කර නොතිබුණු අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව සභාවේ කර්මාන්ත කාර්යය සාධනය පහළ මට්ටමක තිබුණි.

### 5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

----------------------------

2014 පෙබරවාරි 11 දිනැති අංක PFD/RED/01/01/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදයේ විධිවිධාන සම්පූර්ණ වන ආකාරයට වාර්ෂික ක්‍රියාකාරී සැලසුමක් සකස් කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

---------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 (1) (අ) (1) ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතිබුණු අතර අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණි.

### 5.4 සේවක ණය

--------------

ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 09 දෙනෙකුගෙන් රු.708,303 ක් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු අතර නිලධාරින් 23 දෙනෙකුගෙන් අයවිය යුතු රු.148,098 ක ණය ශේෂයක් අයකර ගත නොහැකි ණය ලෙස නිරීක්ෂණය විය. මේ සඳහා කාල විශ්ලේෂණයක් ද ඉදිරිපත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ගිණුම්කරණය

(ඈ) ආදායම් පර